සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :

i. සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

ii. අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයන්හි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.**

01 දේශපාලනඥයන් අතරේ ඇති වූ **කඹ ඇදීම** නිසා පාලම සෑදීමේ කාර්යය නතර විය.
(1) කිසියම් තීරණයක් ස්ථිර වුණ නිසා (2) එකඟතාවක් නොමැතිකම නිසා
(3) දේශපාලන අක්‍රමිකතා නිසා (4) කඹ අදින ක්‍රීඩාවක් ආරම්භ කළ නිසා

02 කම්හලේ සේවකයන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් මෙවරද අධ්‍යක්ෂතුමා **සුදුහුණු ගෑමක** යෙදුණ බව කම්කරු නායකයා පැවසුවේ ය.
(1) ලෙන්ගතුකමක් පැවසීම (2) අභියෝගයකට මුහුණ පෑම
(3) සත්‍ය වසන් කිරීමක් (4) තීන්ත ආලේප කිරීමක්

03 සිරිමිත්ත කළේ **අඟින් කිරි දෙවීම** වැනි වැඩක් යැයි ඔවුහු සැක කළහ.
(1) අනවශ්‍ය බලාපොරොත්තු දීමක් (2) දරුවන්ට කිරි ලබාදීම
(3) කාර්යයෙන් ලිස්සා යෑමක් (4) නිෂ්ඵල කාර්යයක් කිරීමක්

- **අංක 04 සිට 06 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

04 ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ශ්‍රී ලාංකිකයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ .................................. ඔවුන් පෙළඹවීම සඳහා කළ නිර්මාණයන් බොහෝ ය.
(1) ආත්මාර්ථ කාමිත්වයෙන් (2) දේශානුරාගයෙන්
(3) පරාර්ථකාමිත්වයෙන් (4) පරමාභිලාෂයෙන්

05 ජීවිත තක්ෂලාවෙන් ලබන පරිණත බුද්ධියත්, ග්‍රන්ථ පරිශීලනයෙන් ලබන බහුශ්‍රැතභාවයත් ......................... යනුවෙන් අදහස් කරයි.
(1) සිතතභ්‍යාස (2) ව්‍යුත්පත්තිය (3) ප්‍රතිභාව (4) අනුභූතිය

06 අධ්‍යාපනයේ දී .................................. හිමිවිය යුත්තේ ප්‍රමාණාත්මකභාවයට නොව ගුණාත්මකභාවයට ය.
(1) උචිතානුචිත (2) ප්‍රමුඛත්වය (3) ප්‍රබලත්වය (4) යෝග්‍යතාව

- **අංක 07 සිට 09 තෙක් ප්‍රශ්නවල සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.**

07 (1) ආරක්ෂණය, සාංස්කෘතික, අධ්‍යයනය, පුස්තකාලය
(2) අනුපිළිවෙළ, ලේඛනය, අමිනෂ්ට, කනිෂ්ඨ
(3) කුලුණින්, සංසරණය, විමර්ශණය, විශ්ලේෂණ
(4) අධිෂ්ඨානය, සංවත්සරික, පිළිකෙව්, මර්ධනය

08 (1) නෂ්ටාවශේෂ, සුපුෂ්පික, සන්තුෂ්ඨිය, වර්ධනය
(2) ගාම්භීරත්නය, අවස්ථෝචිත, වාක්කෝෂය, න්‍යෂ්ඨිය
(3) ධ්වනිපූර්ණ, විස්මයාවහ, කාව්‍යෝක්ති, හසළත්වය
(4) සුලලිත, සියළඟ, සාම්ප්‍රදායික, අජාතශත්‍රැ

09 (1) ශ්වේත ඡත්‍රය, ජ්‍යොෂ්ඨ, ශීර්ෂපාඨ, සණ්ඨාර

(2) ජනගහණය, සුළැගිල්ල, මලල ක්‍රීඩා, ලේඛම්වරයා

(3) ක්‍රීඩාංගනය, ප්‍රස්තාවපිරුළු, ආපණශාලාව, ආභාසය

(4) රිද්මානුකූල, සමස්ථලංකා, අත්‍යවශ්‍ය, සාමාර්ථ්‍යය

10 එක් එක් වචනයේ දෙවැනි අකුරේ ඇලපිල්ල, කෙටි ඇදය, දීර්ඝ පාපිල්ල, ඉස්පිල්ල පිළිවෙළින් යොදා ඇති වචන සහිත පද පේළිය තෝරන්න.

(1) අවැඩක්, කුරුල්ලා, නපුරු, අක්කා (2) විනාශය, බලාපොරොත්තු, කැමැත්ත, නින්දා

(3) විවාහය, කැරැල්ල, අපූරු, කුපිරිස් (4) කමීය, කවුරුත්, සනුල්‍යා, මහින්ද

- **අංක 11 සිට 12 තෙක් ප්‍රශ්නවල අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.**

11 (1) කනගාටුව, කමනි, කරුණාවන්ත, මහේශාක්‍ය

(2) අන්තඃපුරය, ඇතිින්න, ගෞරවය, කෛරාටික

(3) ගයාන්, ගයනි, හේෂිත, මනුකලාල්

(4) ස්තූපය, සමූපකාරය, කෞතුකාගාරය, මහාතිත්ථ

12 (1) දූරිය, දේමිණි, දොඩම්, දෝණි (2) අමරාවති, ඉන්ද්‍රාණි, ආවර්ජනා, උෂාන්

(3) ගයනි, ගයාන්, ගෞරවය, ගෞරවණීය (4) බුත්සරණ, කව්සිළුමිණ, සසඳාවත, මුවදෙව්දාවත

13 මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන පදයක්** ඇතුළත් වරණය තෝරන්න.

(1) වන - අරණ්‍ය, අටවි, කැළය, අරණ (2) චන්ද්‍රයා - තාරපති, සිසි, නිශාචර, සඳ

(3) ශක්‍රයා - විදුරවි, වජප්‍රාණ, පුරඳුරු, සහසැස් (4) ව්‍යසනය - කරදරය, විපත, විකසනය, විපැත්තිය

14 මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් **නොදෙන පදයක්** ඇතුළත් පද පේළිය තෝරන්න.

(1) නීච - උත්තම, උත්කෘෂ්ට, පවර, අධම (2) ශාන්ත - රෞද්‍ර, කුරිරු, රළු, චණ්ඩ

(3) බල - අබල, බෙලහීන, ප්‍රබල, දුබල (4) ආලෝක - අන්ධකාර, අඳුර, තිමිර, කළුවර

15 පහත අක්ෂර අතරින් අඝෝෂ මහප්‍රාණ අක්ෂර කාණ්ඩය වනුයේ,

(1) ඝ, ඣ, ඪ, ධ, භ (2) ඛ, ඵ, ඨ, හ, ධ (3) ඛ, ඡ, ඨ, ථ, ඵ (4) ඹ, ඪ, හ, ඵ, ධ

- **අංක 16 සිට 18 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසට වඩාත් සමීප අදහස සහිත වරණය තෝරන්න.**

16 තමන් වහන්සේගේ කරුණ නමැති **අකුස්සෙන්** පැහැර ඇතු රඳවලා ....

(1) අක්තපත්‍රයෙන් (2) ඉවසීමේ ගුණයෙන් (3) හෙණ්ඩුවෙන් (4) සණ්ඨාරයෙන්

17 **විලිකුන්** සුරත් එල වැනි වේ රිවි මඩල ....

(1) තදරතු (2) ඉදුණු (3) කහවන් (4) ලජ්ජාව

18 එතෙපුල් නමැති **අමාහැල්ලෙන්** කෝ ගිනිකඳ නිවී ගියහ.

(1) වර්ෂාවෙන් (2) අමෘතයෙන්

(3) තෙපුල්වලින් (4) අමෘතය නමැති දිය දහරින්

19 පහත ක්‍රියාපද පිළිවෙළින් නම් කර ඇති වරණය වනුයේ,

වැජඹේවා, බලව, නැටුවොත්, කියමින්

(1) ආශිර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(2) විධික්‍රියා, ආශිර්වාද ක්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍රක්‍රියා

(3) ආශිර්වාද ක්‍රියා, විධික්‍රියා, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(4) ආශිර්වාද ක්‍රියා, විධික්‍රියා, කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

20 ගැළපෙන යුගල සහිත වරණය තෝරන්න.

| | | | |
|---|---|---|---|
| A | හංස සන්දේශය | a | කවීශ්වර |
| B | මයූර සන්දේශය | b | මයූරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමි |
| C | අමාවතුර | c | වීදාගම මෛත්‍රීය හිමි |
| D | පූජාවලි | d | ගුරුළුගෝමී |

(1) Ac, Bb, Ca, Dd (2) Aa, Bc, Cb, Dd (3) Ac, Bb, Cd, Da (4) Ac, Ba, Cd, Db

21 විජයබා කොල්ලය නවකතාවේ කතුවරයා වනුයේ,

(1) කේ. ජයතිලක මහතා. (2) ඩබ්. ඒ. සිල්වා මහතා
(3) ඒ. වී. සුරවීර මහතා (4) මහගමසේකර මහතා

22 උඩරැටියන් 'බූන්නා' ලෙස ව්‍යවහාර කරනු ලබන්නේ,

(1) දූම්මා යන්නට ය. (2) කුඩාකොලු ගැටයා යන්නට ය.
(3) බීවා යන්නට ය. (4) නැන්දම්මා යන්නට ය.

23 මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නොවන පදයක්** සහිත පිළිතුර තෝරන්න.

(1) උපසර්ග - ප, පර, අබි, නො
(2) නිපාත - සේ, විසින්, බඳු, ඊයේ
(3) විධික්‍රියා - අසව, නට, දෙනු මැනවි, අසත්
(4) තද්ධිත - ධෛර්‍යවත්, ස්වදේශීය, ශිෂ්‍යත්ව, පුරාතන

24 නිවැරදි අර්ථ සහිත පද පේළිය තෝරන්න.

(1) ප්‍රහර්ෂය - අධික සන්තෝෂය, සර්වාංගය - සියලු ශරීරය, හසළත්වය - නිපුණත්වය, විස්මයෝත්ඵුල්ල - දූඩිබව
(2) වාමාචාර්ථය - මතුපිට අර්ථය, පුපුරුම් - පිරුණු, සොඬු - දත්, වාල් - දාසයා
(3) නරමුල් - පැසුණු කෙස්, රොස්තොට - කෝප වී, පා පිට - පය අසල, පිළිබහා - වළක්වා
(4) ළෙහි - ලය, යුගත්ගිනි - අතෙහි ගින්දර, මිහිකත - පොළොව, හළුයේ - ඇකිලී ගියේ

25 නිවැරදි අදහස දෙන වරණය තෝරන්න.

(1) අනුස්වාරය, වචනයක මුල යෙදිය හැක.
(2) දැත යන්න පූර්ව ස්වර ලෝප සන්ධියකට උදාහරණ ය.
(3) කියග මගිය එනු කොහි සිට යන වාක්‍යයේ කියග යනු අසම්භාව්‍ය ක්‍රියාවකි.
(4) කුමරා යන්නෙහි නාම ප්‍රකෘතිය වනුයේ කුමර යන්න ය.

26 ප්‍රීති + උත්සවය යන්න නිවැරදිව සන්ධි කළ විට ලැබෙනුයේ,

(1) ප්‍රීත්‍යුත්සවය (2) ප්‍රීතෝත්සවය (3) ප්‍රීතීත්සවය (4) ප්‍රීතිඋත්සවය

- **දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

27 අගයක් නොමැති වීම.

(1) කැලේට පායපු හඳ වගේ (2) කටුස්සගෙ කරේ රත්තරන් බැන්දා වගේ
(3) අටුව කඩා පුටුව හැදුව වගේ (4) පරංගියා කෝට්ටෙ ගියා වගේ

28 පහත ප්‍රස්තාව පිරුළට අදාළ අදහස වනුයේ,

පිදුරු ගොඩේ ඉන්න බල්ල වගේ

(1) යමක් ක්‍රියාත්මක නොකොට අනුන් ලවා කරවා ගැනීම.
(2) අවශ්‍ය දේ අවශ්‍ය කාලයට නොකර බලන් ඉඳීම.
(3) කිසිම කෙනෙකුට කිසිම දෙයක් නොදීම.
(4) තමන් නොකරන කාර්යය අනුන්ට ද කිරීමට නොදීම.

29 අනුක්ත නාමපද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ගැහැණියක්, දරුවන්, ඔවුහු, නුඹ (2) රීතීන්, මා, තොප, දූරියක
(3) රජතුමා, තා, මැණියෝ, තාරකාවන් (4) ග්‍රන්ථයක්, නීතින්, බල්ලෙකු, නෑදෑයෝ

30 දී ඇති අක්ෂර ගැළපීමෙන් වැරදි පද පිළිවෙළ ඇතුළත් වරණය වන්නේ,

(1) තිප්‍රර්නිමාණය (2) භාප්‍රතිව (3) රිකපල්යන (4) තහ්‍යාසතස

- **අංක 31, 32, 33, 34 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍යය තෝරන්න.**

31 (1) සියලු කම්කරුවෝ සේවයට පැමිණ ඇත. (2) සමන් නරියෙකු මෙන් කපටි වෙයි.
(3) අපි සියලුදෙනාට උවටැන් කරනු වටී. (4) දක්ෂ ක්‍රීඩිකාවක් වන්නේ කෙසේ ද?

32 (1) මැණියන් දැ උදෙන්ම මල් පූජා කිරීමට බෝධියට වඩින්නා ය.
(2) දරුවෝ තම දෙමාපියන්ට කීකරු වීම මැනවි.
(3) ඇය අනාගතයේ දී දක්ෂ ක්‍රීඩිකාවක වෙයි.
(4) දරුවන් හොඳින් පාඩම් කළහ'යි දෙමව්පියෝ සිතති.

33 (1) මා විසින් ඔවුහු ප්‍රශංසා කරන ලදී.
(2) ඔවුන් දිනපතා දරුවන්ට හොඳින් සලකති.
(3) දරුවන් උදෙසා ආහාර රැසක් රජය විසින් දෙනු ලැබේ.
(4) ඕතොමෝ ගමට ගියහ.

34 එකම කාලයක දී පැවතුණ යන යෙදුම සඳහා වඩාත් සුදුසු තනි පදය වනුයේ,
(1) තාවකාලික (2) සමකාලීන (3) දීර්ඝකාලීන (4) චිරන්තන

35 දී ඇති වරණ අතුරෙන් පහත කවියේ දෙවන පදය තෝරන්න.

ලීල් නැතිව නිසරුව තෙපලන්නේ
..................................................................
වාල් තමාවත් ඇද්ද ඉතින්නේ
වාල් විඳින දුක මෙනුම විඳින්නේ

(1) හැමකල් මළ දා දෝ සැප වන්නේ (2) මහල්ල නුඹගේ හිමි ද අසන්නේ
(3) පෙරකල් ජාතියෙ පැතුවා වැන්නේ (4) නරමුල් ඇඟ ඇට කිඹුලකු වැන්නේ

36 ''අවුරුදු හතළිහයි හාමුදුරුවනේ'' මෙම පාඨය ඇතුළත් පාඩම වනුයේ,
(1) හුණුවටයේ කතාව (2) ආපදා කළමනාකරණය
(3) මං තනන්නෝ (4) එතෙපුල් අමා හැල්ලෙන්

37 පහත වාක්‍ය අතරින් රූපකයක් යෙදී <u>නොමැති</u> පේළිය තෝරන්න.
(1) බුදුන් කෙරෙහි අවිනෂ්ටව කළා වූ මහ පෙම් වතුරු රඳවා.
(2) ඇගෙ වත කමල දුටු මට ප්‍රබෝධයක් ඇති විණ.
(3) එබූ එබූ පයින් මහ පොළොව පළාපියන්නා සෙ දිවෙන ඇත් රජය.
(4) එතෙපුල් නමැති අමාහැල්ලෙන් කෝ ගිනි කඳ නිවී ගිය ......

38 පහත සඳහන් වාක්‍ය ලේඛන ව්‍යවහරයට හැරවූ විට වඩාත් නිවැරදි වන්නේ කුමක් ද?
''මා පාසලට යද්දී මිතුරන් මුණ ගැහුණ.''
(1) මම පාසලට යනකොට මිතුරන් හමුවුණා.
(2) මා පාසලට යද්දී මිතුරෝ හම්බ වුණි.
(3) මම පාසලට යද්දීම මිතුරෝ මුණගැසුන හ.
(4) මා පාසලට යද්දී මිතුරෝ මුණගැසුණ හ.

39 මින් සුගතපාල ද සිල්වා මහතාගේ නාට්‍යයක් වනුයේ,
(1) සුබ සහ යස (2) දෝන කතිරිනා (3) දුන්න දුනු ගමුවේ (4) ගුරු තරුව

40 පහත සඳහන් කවියේ අදහසට වඩාත් සමීප අදහසට දෙන පිළිතුර තෝරන්න.

සුනෙර මතින් අලළන සඳ කිරි සයුර
ඉතිර වෙරළ දිවයන මෙන් රළ පතර
පැතිර උදය ගිරි සිරසින් දිලි නො හැර
මිතුර බලා ලව එන සඳ රැස් වතුර

(1) මිතුර මහාමේරු පර්වතය පාමුළ සිට කිරි සයුර කලබන විට වෙරළ ඉතිරී ගොස් සිරස මුදුනින් අත් නොහැර යන්නා වූ උදය පර්වතයෙහි මුදුනින් එන සඳරැස් බලන්න.
(2) මිතුර මහාමේරු පර්වතය මන්ථය ලෙස ගෙන කිරි සයුර කලඹන විට වෙරළ ඉතිරී පැන දුවන රළ පහර මෙන් අත් නො හැර දිළිසෙන්නා වූ උදය පර්වතයාගේ මුදුනින් එන්නා වූ සඳරැස් බලන්න.
(3) මහාමේරු පර්වතය සිට කෙනෙක් කිරි සයුර කලඹන විට වෙරළ දිවයන්නාක් මෙන් පෙනේ. එවිට දිළිසෙන්නා වූ උදය පර්වතයෙහි සඳරැස් බලා එන්න මිතුර.
(4) කිරි සයුර කැලඹූ විට වෙරළ තීරය ඉක්මවා පිරී ඉතිරී යයි. එවිට උදය කාලයේ දී කඳු සිරස මුදුනින් සඳරැස් විහිදෙයි. එම සඳරැස් වහා බලා එව මිතුර.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

## 10 ශ්‍රේණිය සිංහල භාෂාව හා සාහිත්‍යය - II කාලය පැය 02 යි.

නම/ විභාග අංකයඃ

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු 80 කි.

- අංක **(i)** සිට **(x)** තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) අර්ධානුනාසික්‍ය අක්ෂර දෙකක් ලියන්න.

(ii) පහත වචනවල අක්ෂර වින්‍යාසය වැරදිය. එය නිවැරදි කර ලියන්න.

(අ) ශබ්ද විකාසනය

(ආ) නිශ්ඵල උත්සහය

(iii) පහත දැක්වෙන පදවලින් දැක්වෙන කාව්‍ය අලංකාරය නම් කරන්න.

(අ) නෙත් අඹ වගෙයි

(ආ) පා පොල් කෙඳි තොටිල්ලකි

(iv) පහත වාක්‍ය නිවැරදි කර ලියන්න.

(අ) නගර ප්‍රශ්න විසඳීම සඳහා නගරවාසීහු ඉදිරිපත් වීම මැනවී.

(ආ) සියලු ජය ලැබුවෝ මහින්ද විද්‍යාලයේ ශිෂ්‍යයින් වූහ.

(v) පහත වාක්‍යයේ ඇති නිපාත පද දෙකක් උපුටා ලියන්න.

''යළි කොළඹ වෛද්‍ය විද්‍යාලයට පැමිණි ඔහු ශිෂ්‍යයන් පෙලඹවූයේ නිර්මාණාත්මක අධ්‍යාපනයක් සඳහා ය.''

(vi) පහත වාක්‍යයේ යෙදී ඇති උපසර්ග පද දෙකක් උපුටා දක්වන්න.

''වන මැද වැඩුණු සුවිසල් ගස්, ගැමියන්ට නිර්ලෝභී ව මල් ඵල පිරිනමයි.''

(vii) පහත සඳහන් පද සන්ධි කරන්න.

(අ) මේ + අත -

(ආ) ගිනි + කම් -

(viii) පහත සඳහන් වාක්‍ය කර්මකාරක වාක්‍ය බවට හරවන්න.

(අ) ළමයි සුරතල් මසුන් ඇති කරති.

(ආ) ගුරුවරු අප ඇමතූහ.

(ix) මේ අදහස්වලට ගැළපෙන රූඩි පද ලියන්න.

(අ) ලැබෙන්න ගිය ලාභයට හානි කිරීම.

(ආ) හැකි කම් පිරිහී ගොස් තිබීම.

(x) පහත සඳහන් පදවල සමාන්‍ය ව්‍යවහාරය ලියන්න.

(අ) ඔයනවා -

(ආ) කුදහනවා - (ලකුණු 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) රටක ආර්ථික රටාව එහි සංවර්ධනය කෙරෙහි බලපාන්නකි. පෙර ශ්‍රී ලංකාව කෘෂිකර්මයට බරවී තිබිණි. පසුගිය කාලය තුළ කර්මාන්ත කෙරෙහි ද සැලකිල්ලක් දැක්විණි. රට ඉක්මනින් සංවර්ධනය වීමට නම් කෘෂිකර්මාන්ත හා කර්මාන්ත යන අංශ දෙක ගැන උනන්දු විය යුතුය. මේ සඳහා සැලසුම් කළ ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. (ලකුණු 25)

(ආ) ගමනාගමන පහසුකම් ජනතාවට ඉතා වැදගත් ය. රටක ගමනාගමනය ජනතාවගේ ජීවන රටාවත් රටේ සමස්ත සංවර්ධනයත් සමග දැඩි ලෙස බැඳී පවතී. ශ්‍රී ලංකාවේ ගමනාගමන පහසුකම් දියුණු වෙමින් පවතියි. මේ පහසුකම් තවදුරටත් වර්ධනය කිරීම සඳහා ගත හැකි පියවර බොහෝ ය.(ලකුණු 25)

(ඉ) ඉතා කුඩා වර්ෂාවකට පවා ජල ගැලීම් සිදුවන තත්වයක් අප රටේ බොහෝ නගරවල දැකගත හැකිය. ගේදොර පමණක් නොව ඇතැම්විට ජීවිත විනාශද සිදුවේ. වැඩිවන ජනගහන හමුවේ ඉඩම් වැඩි නොවීමත් නාගරික තදබදයත් මීට බලපා ඇත. අසංවිධිත ඉදිකිරීම්, ක්‍රමානුකූල නීතිරීති පද්ධතියක් නොමැතිකම හා ජල මාර්ග පද්ධතිවලට අපද්‍රව්‍ය දැමීම ද මීට බලපා ඇති බව පැහැදිලි සත්‍යයකි. මේ ගැටලුවට විසඳුම් තිබිය යුතුය. (ලකුණු 25)

(ඊ) අතීතයේ අපේ රටේ තිබුණේ දියුණු පවුල් සංස්ථාවකි. පවුලේ දුක සැප බෙදා ගනිමින් මව හා පියා දරුවන් සමඟ සතුටින් කල් ගෙව්වද වර්තමානයේ කාන්තාව පවුල නඩත්තු කිරීමට රට රැකියාවලට යාම සිදුවී ඇත. ඒ සඳහා ඉඩම් විකුණා ණය තුරුස් වී රටගියත් බොහෝ කාන්තාවන් ආපසු පැමිණෙන විට තම පවුල විනාශ වී ගොස් හමාර ය. රට රැකියාවලට යන කාන්තාවන්ට අත්විඳීමට සිදුවන පීඩා ද සුළුපටු නොවේ. (ලකුණු 25)

(03) පහත දැක්වෙන ඡේදය වචන ගණන 50-60 අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

කිසියම් සමාජයකට අයත් සංස්කෘතියක් වෙනස්වීම්වලට ලක්වන විට ඊට අයත් සාරධර්ම ද වෙනස්වීම්වලට ලක්වෙයි. ඉතා අගය කළයුතු දෑ ලෙස පරම්පරාවෙන් පරම්පරාවට පැවත එන මූලික ප්‍රතිපත්ති පද්ධතිය වූ සාරධර්ම ඈත යුගවල සිට පැමිණි දඹදිව දාර්ශනිකයන් විසින් හඳුන්වන ලද්දේ ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ යනු විසිනි. මේවා පොදුවේ සතර පුරුෂාර්ථ යනුවෙන් හැඳින්වේ. ලංකාවේ නම් ඈත යුගවල සිට ගොඩනැගී ඇත්තේ බුදු දහම මුල්කොටගත් සාරධර්ම පද්ධතියකිනි. මේවා සමාජ වටිනාකම් ලෙසින් ද හැඳින්විය හැකිය.

තමන්ට රුචි වූ දෑ ළඟා කර ගැනීමටත් අරුචි වූ දැයින් ඈත් වීමටත් ගනු ලබන උත්සාහයෙන් ම බොහෝ දෙනෙකුගේ ජීවිත පිරී පවතී. මෙය මානව ඉතිහාසයේ කවර කාලපරිච්ඡේදයක් සම්බන්දයෙන් වුව ද එක සේ දක්නට ලැබෙන සත්‍යයක් ලෙස සැලකීමට පුළුවන.

එක් එක් පුද්ගලයා විසින් ඇති කරනු ලබන කැමති - අකමැතිකම් වලට අනුව මුළුමහත් සමාජය ම පවතින රුචි අරුචිකම හා ප්‍රාර්ථනා සකස් වේ. කල්යෑමේ දී විවිධ සමාජ සංස්ථා ගොඩනැගෙන්නේ ද මේවා අනුව යමිනි. කිසියම් කලක ජීවත්වන්නවුන්ගේ බහුමතට ලක් වූ සමාජ වටිනාකම් හඳුනාගැනීමේ කාර්යේ දී ඔවුන් අතර පැවති වැදගත් සමාජ සංස්ථා කවරේ දැයි වටහා ගැනීමට ද අවශ්‍ය වන්නේ මේ මෙයිනි. (ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මෙරට අධ්‍යාපනයෙන් බිහිවන පුද්ගලයාට තමා හැඳින ගැනීමේ හැකියාව ද අවශ්‍ය වේ. මෙය නව සංකල්පයක් නො වේ. චිරාගත වූවකි. උපනිෂද්හි 'ආත්මවිත්' ලෙස දැක්වෙන්නේ ස්වයං දැනීම ය. බෞද්ධ දර්ශනයේ දී 'අත්ත දීපා විහරථ' (තමාට පහනක් වන්න), 'අත්තනෝව අවෙක්ඛෙය්‍ය' (තමා ම සොයන්න) යනාදී අයුරින් සාකච්ඡාවට භාජනය වන්නේ මේ අදහස ය. සොක්‍රටීස් පවසන අන්දමට 'ඔබ ඔබ ම දැනගන්න' (Know thyself) යනු ද මේ චින්තාව ම ය. අධ්‍යාපනයේ දී තමා කවුරු දැයි හැඳින ගැනීමට පුද්ගලයාට සහාය වීම අත්‍යවශ්‍ය වේ.

අධ්‍යාපනය ලැබූ පුද්ගලයා ස්වකීය කායික මානසික සුවතාව සුරක්ෂිත කර ගනිමින් හා වර්ධනය කර ගනිමින් තමාගේ සංවර්ධනයට මෙන් ම සමාජයේ සංවර්ධනය උදෙසා ද ක්‍රියා කළ යුතු ය. මේ නිසා ශ්‍රී ලාංකිකයා ද සෞඛ්‍ය සම්පන්න පුද්ගලයකු වීම වැදගත් කරුණකි. ආරෝග්‍යය පරම ලාභයක් වේ යන්න මොනවට බුදුදහමේ පැහැදිලි කර තිබේ. 'නරාණ කළ කමට ඉඳුරාණ දෙස්' (සිදත් සඟරාව) නම් පාඨයෙන් හැඟවෙන්නේත් සිත කය දෙක මැනවින් භාවිත කිරීම ජීවත්වීමේ දී අවශ්‍ය බව යි.

(i) ශ්‍රී ලාංකික අධ්‍යාපනයෙන් බිහිවන පුද්ගලයාට අවශ්‍ය වන්නේ කුමක් ද?

(ii) උපනිෂද්හි 'ආත්මවිත්'' ලෙස දැක්වෙන්නේ කුමක් ද?

(iii) බෞද්ධ දර්ශනයේ සාකච්ඡාවට බඳුන් කරන කරුණු දෙකක් නම් කරන්න.

(iv) ශ්‍රී ලාංකිකයා සෞඛ්‍ය සම්පන්න පුද්ගලයකු වීම වැදගත් වන්නේ ඇයි?

(v) සිදත් සඟරා පාඨයෙන් හැඟවෙන්නේ කුමක් ද? (ලකුණු 2 x 5 = 10)

(05) රුවන්පුර ප්‍රදේශයේ පුවත්පත් වාර්තාකරුවෙකු වන හේමක නේමින්ද තබා ගත් සටහනක් පහත දැක්වේ.

- * ප්‍රදර්ශනයේ නම :- ''සාම්ප්‍රදා''
- * තේමාව :- අපේ මුතුන් මිත්තන් භාවිත කළ භාණ්ඩ හා ඒවායේ අනුරූ ප්‍රදර්ශනය
- * දිනය :- 2020. 12. 27
- * ස්ථානය :- මීගස්තැන්න ''සියැස'' කලා සංසද මූලස්ථානය
- * ප්‍රධානත්වය :- * රුවන්පුර ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන
  * ආරාධිත පළාත් සභා නියෝජිතයින්
- * මෙහෙයවීම :- මීගස්තැන්න ''සියැස'' කලා සංසදය

උක්ත සටහන ආශ්‍රයෙන් වචන 100 - 125 අතර වනසේ පුවත්පත් වාර්තාවක් සකස් කරන්න. (ලකුණු 15)

**නැතහොත්**

මාලනි කුමාරි වන ඔබ ලේකම් ධූරයත් විමල් රත්නායක සභාපති ධූරයත් දරන දෙවිනුවර තරුණ කවි සමාජයේ රැස්වීම් ශාලාවේදී පැවැත්වෙන චිත්‍ර තරගයට සහභාගි වීම සඳහා පැමිණෙන ලෙස ආරාධනා කරමින් චිත්‍ර ශිල්පීන් වෙත යැවීම සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

(තරග පැවැත්වෙන දිනය, වේලාව හා වැඩ සටහන ඔබට අභිමත පරිදි යොදාගත හැකිය.) (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# තෙවන වාර පරීක්ෂණය 2020

**10 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය - III** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් ප්‍රශ්න එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව 80 කි.

---

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) ගංගාවේ සංගීතය පද්‍ය පන්තියේ රචකයා නම් කරන්න.
(ආ) ඔහු සංස්කරණය කළ කවි සඟරාව කුමක් ද?

(ii) (අ) 'නන්දන ගීත' කවුරුන් විසින් රචනා කළ කෘතියක් ද?
(ආ) එම රචකයාගේ තවත් කෘතියක් නම් කරන්න.

(iii) (අ) පන්සිය පනස් ජාතක පොත ලියවුණ සියවස නම් කරන්න.
(ආ) ගී වීරිතෙන් ලියවුණ ජාතික කාව්‍යයක් නම් කරන්න.

(iv) (අ) ''VILLAGE IN THE JUNGLE'' කෘතිය ලියවුණ වර්ෂය කුමක් ද?
(ආ) ඉහත කෘතියේ අනුවර්තකයාගේ නම කුමක් ද?

(v) (අ) දෙවියන් උදෙසා පුද පූජා පැවැත්වීමේ දී ජනයා විසින් ගයන ලද කාව්‍ය විශේෂයක් සඳහන් කරන්න.
(ආ) ජන කවි පිළිබඳ තොරතුරු ඇතුළත් පැරණිම කෘතිය කුමක් ද?

(vi) පහත සඳහන් අය විසූ නුවරවල් සඳහන් කරන්න.
(අ) ගුත්තිල ඇඳුරුතුමා
(ආ) මූසිල ගාන්ධර්වයා

(vii) ''මම බාලයෙමි තොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි''
(අ) ඉහත ප්‍රකාශයේ මම යනු කවුරුන් ද?
(ආ) මේ ප්‍රකාශය කළේ කා හට ද?

(viii) 'ඔකට ගිය මිනිහෙක් කවදාවත් එළියට එන්නේ නෑ'
(අ) 'ඕකට ගිය' යනුවෙන් අදහස් කළේ කුමක් ද?
(ආ) මේ ප්‍රකාශය කළේ කා හට ද?

(ix) (අ) සිංහබාහු නාට්‍යයේ රචකයා නම් කරන්න.
(ආ) ඔහු ලියූ නව කතාවක නම ලියන්න.

(x) පහත සඳහන් කෘතිවල කතුවරු ලියන්න.
(අ) හුණුවටයේ කතාව
(ආ) කුණාටුව (ලකුණු $2 \times 10 = 20$)

(02) පහත සඳහන් කොටස් ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(i) යටැසින් ලන බැල්මෙන් <u>සුර විලසී</u>
වෙසෙසින් දන මන මත් කැර <u>එකසී</u>
අහසින් බැස රඟගත් රඟ කෙලෙසී
දිසිමෙන් විය විදුලිය සිය දහසී

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) පසුව මුළු කොටසේ ම අදහස ලියන්න.

(ii) ''පණ්ඩිතයන් වහන්සේ ගිරා පෝතකයනට කළ මනා සත්කාර කොට හෙවත් මීයෙන් හැනූ විලද කවා, මී පැන් පොවා, බේත් තෙලින් පියා සඟළ මැඬ, මොළොක් ඇතිරිලි අතුරන ලද රන් මැදිරියෙහි සතප්පා'

(අ) ඉදි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න.

(iii) නිරිත දිග සුළඟට ඇඹරවී ඇටුවන් බැගී ගිය ගහක් මෙන් ඇගේ ශරීරය ද නැමී ඇඹරී තිබිණ. මුහුණේත් සිහින් ව ගිය අත්පාවලත් සම ගසක පොත්තක් මෙන් ගොරහැඩිව රැලි වැටී ඇටයට ඇලී ගියේ ය.

(අ) ඉදි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) ඉහත කොටසේ ඇති උපමා දෙකක් ලියන්න.

(iv) රන් විමනේ සිටි මුත් දුක නැති වෙද්ද
පැණි මීයේ කෑ මුත් බඩ ගිනි නැද්ද
මිණි බරණින් සැදූ මුත් ගත නොදිරද්ද
පැණි වරකා ගසටත් හෙණ නොවදිද්ද

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න.

(v) පටහැනි වෙන්ටා නොව ඔහු අණටා
වෙන මඟ ගැලවෙන්ටා
නොපෙනෙන කලටා සැරසෙනු කුමටා
මා දූන් වළකන්ටා

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.

(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න. (ලකුණු 4 x 5 = 20)

(03) (i) අසීමිත ලෙස දරුවන්ට ආදරය කරන පියකුගේ චරිතයත්

(ii) දරුවන්ගේ අනාගත සුබ සිද්ධිය පතන මවකගේ චරිතයත් සිංහබාහු නාට්‍යයෙන් ඉස්මතු වේ. නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) පුද්ගලයකු සතු විය යුතු ජාතික මෙහෙවර පෙන්වා දීමත්

(ii) දේශානුරාගය ඉස්මතු කරවීමත් යන කරුණු නිසා දරු නැළවිල්ල පද්‍ය පන්තිය සාර්ථක නිර්මාණයක් වී ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(04) (i) රසවත් උපමා යොදා ගැනීමත්

(ii) ප්‍රබල සංවාද භාවිතයත් උම්මග්ග ජාතක කතාවේ සාර්ථකත්වයට තුඩු දී ඇති අයුරු නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) සර්වකාලීන වටිනාකමක් සහිත උපදේශ සැපයීමත්

(ii) සරල ගැමි ජන බස භාවිතයත් යන කරුණු නිසා උපදේශ කාව්‍ය ජනප්‍රිය වී ඇති අයුරු එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(05) අජීවී පරිසරයට සජීවී බවක් ආරෝපනය කිරීම ගංගාවේ සංගීතය පැදි පෙළ සාර්ථක වීමට බලපා ඇති ආකාරය උදාහරණ 3 ක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(06) චරිත හා අවස්ථා සජීවි ලෙස ඉදිරිපත් කිරීමට බැද්දේගම කතුවරයා උපමා භාවිතා කර ඇති ආකාරය ඔබට නියමිත කොටසින් උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(07) ''ගුත්තිල ඇඳුරුතුමා විශිෂ්ට වීණා වාදකයෙකි'' යන කියමන ඔබට නියමිත කොටසින් උදාහරණ තුනක් දෙමින් විස්තර කරන්න. (ලකුණු 10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | |
|---|---|---|---|
| 1 - (2) | 11 - (1) | 21 - (2) | 31 - (2) |
| 2 - (3) | 12 - (1) | 22 - (3) | 32 - (4) |
| 3 - (4) | 13 - (4) | 23 - (1) | 33 - (3) |
| 4 - (4) | 14 - (3) | 24 - (3) | 34 - (2) |
| 5 - (2) | 15 - (3) | 25 - (4) | 35 - (2) |
| 6 - (2) | 16 - (3) | 26 - (1) | 36 - (1) |
| 7 - (2) | 17 - (2) | 27 - (1) | 37 - (3) |
| 8 - (3) | 18 - (4) | 28 - (4) | 38 - (4) |
| 9 - (1) | 19 - (3) | 29 - (2) | 39 - (3) |
| 10 - (3) | 20 - (4) | 30 - (3) | 40 - (2) |

## II කොටස

(නිවැරදි පිළිතුරකට ලකුණු 01 බැගින්)

01 (i) ග, ජ, ඩ, ද, බ

(ii) (අ) ශබ්ද විකාශනය (ආ) නිෂ්ඵල උත්සහය

(iii) (අ) උපමා / උපමාන (ආ) රූපක

(iv) (අ) නගර ප්‍රශ්න විසඳීම සඳහා නගරවාසීන් ඉදිරිපත් වීම මැනවි.

(ආ) සියලු ජය ලැබුවෝ මහින්ද විද්‍යාලයේ ශිෂ්‍යයෝ වූහ.

(v) යළි, සඳහා, ය

(vi) සුවිසල්, නිර්ලෝභී

(vii) මෑත, ගිනියම්

(viii) (අ) ළමයින් විසින් සුරතල් මත්ස්‍යයෝ / මස්සු ඇති කෙරෙති, කරනු ලබති, ලබයි.

(ආ) ගුරුවරුන් විසින් අපි අමතන ලදිමු / ලදීමු / ලද්දෙමු.

(ix) (අ) බත් පතේ වැලි දැමීම (ආ) පොරකටු ගෙවිලා

(x) (අ) පොල් ලෙලි ගහනවා. (ආ) නිදාගන්නවා.

02 රචනය සඳහා

| | | | |
|---|---|---|---|
| 1. | සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව | ලකුණු | 08 |
| 2. | සංවිධානය, නිර්මාණාත්මක භාවය ස්වීයත්වය | ලකුණු | 12 |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | ලකුණු | 05 |
| | | මුළු ලකුණු | 25 යි. |

03 ලකුණු විග්‍රහය (සාරාංශය)

1. අන්තර්ගතය (ප්‍රධාන අදහස් සඳහා) - ලකුණු 06
2. වචන ගණන - ලකුණු 02
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 02

ප්‍රධාන අදහස්

* සමාජයක සංස්කෘතික වෙනසක් සමග සාරධර්ම වෙනස් වේ.
* පාරම්පරික සාරධර්ම දඹදෙණි දාර්ශනිකයන් ධර්ම, අර්ථ, කාම, මෝක්ෂ යන සතර පුරුෂාර්ථ වේ.
* ලාංකීය බුදු දහම මුල්කොටගත් සාරධර්ම පද්ධතියක් ඇති අතර එය සමාජ වටිනාකම් ලෙස ද හඳුන්වයි.
* තමා කැමති දේ ළඟා කර ගැනීමටත් අකමැති දේ ඈත් කර ගැනීමටත් බොහෝ දෙනා ක්‍රියා කරයි.
* පුද්ගලයා සකස් කර ගනු ලබන රුචි අරුචිකම් මත සමාජය ගොඩ නැගේ.
* කිසියම් කලක ජීවත් වන්න වන්ගේ ගෞරවයට පත් වූ සමාජ වටිනාකම් හඳුනා ගැනීමට හා ඔවුන් අතර සමාජ සංස්ථා වටහා ගැනීට ද අවශ්‍ය වේ.

04 (i) තමා හැඳින ගැනීමේ හැකියාව.

(ii) ස්වයං දැනීමය.

(iii) * තමාට පහනක් වන්න. / අත්ත දීපා විහරථ

* තමාම සොයන්න. / අත්තනෝව අවෙක්ඛෙය්‍ය

(iv) තමාගේම සංවර්ධන සහ සමාජයේ සංවර්ධනය උදෙසා

(v) සිත කය දෙක මැනවින් භාවිතා කිරීම ජීවිතයට අවශ්‍ය බවයි.

05 (i) පුවත්පත් වාර්තාව
ආකෘතිය - ලකුණු 05
ආකර්ෂණීය ශීර්ෂය - ලකුණු 02
නිර්මාණශීලී බව - ලකුණු 02
වාර්තාකරු - ලකුණු 01
ලකුණු 05
(ii) අන්තර්ගතය - ලකුණු 07
(iii) ශිල්පීය දක්ෂතා - ලකුණු 03 මුළු ලකුණු 5 + 7 + 3 = 15
**නැතහොත්**
ආකෘතිය - ලකුණු 05
අන්තර්ගතය - ලකුණු 07
ශිල්පීය දක්ෂතා - ලකුණු 03
මුළු ලකුණු - 15

## III කොටස

01 (i) (අ) එච්. එම්. කුඩලිගම (ආ) සුවඳ
(ii) (අ) එස්. මහින්ද හිමි (ආ) ඔවාමුතු, නිදහසේ දැහැන (මහින්ද හිමිගේ ඕනෑම කෘතියක්)
(iii) (අ) 14 වෙනි සියවස (ආ) මුවදෙව් දාවත, සසදාවත, කව්සිළුමිණ
(iv) (අ) 1913 (ආ) ඒ. පි. ගුණරත්න
(v) (අ) කෝල්මුර කවි, ගම්මඩු කවි, දෙවොල්මඩු කවි
(ආ) සුත්තනිපාත අට්ඨකථාව / පරමත්ත ජෝතිකාව
(vi) (අ) බරණැස් නුවර (ආ) උදේනි නුවර
(vii) (අ) මහෞෂධ පඬිදුන් (ආ) කේවට්ට බමුණාට
(viii) (අ) හිරගෙට (ආ) පුංචි මැණිකාට
(ix) (අ) මහාචාර්ය එදිරිවීර සරත්චන්ද්‍ර (ආ) මළගිය ඇත්තෝ, මළවුන්ගේ අවුරුදු දා
(x) (අ) හෙන්රි ජයසේන (ආ) එච්. එම්. කුඩලිගම (ලකුණු 2 x 10 = 20)

02 (i) (අ) * දිව්‍යාංගනාවන් / සුරඟනන් * එක සේ / ඒකාන්තයෙන්
(ආ) දිව්‍යාංගනාවන් පහත බලා ගත් ඇසින් හෙළන්නා වූ බැල්මෙන් විශේෂයෙන් ජනයාගේ සිත් ඒකාන්තයෙන් මත්කොට ආකාශයෙන් බැස නැටූ ආකාරය කෙසේදයත් විදුලිය ලක්ෂ ගණනක් එකවර දිස් වූවාක් මෙන් විය. (ලකුණු 2 x 2 = 04)
(ii) (අ) * පියාපත් යුගල පිරිමැද * කුඩුවෙහි
(ආ) මහෞෂධ පණ්ඩිතයන් ගිරවාට කළ යුතු සත්කාර කර හෙවත් මී පැණිවලින් ඇනූ විළ ද කවා මී පැණි පොවා බෙහෙත් තෙල්වලින් පියාපත් යුගල පිරිමැද මෘදු ඇතිරිලි සහිත කුඩුවෙහි තබා (ලකුණු 2 x 2 = 04)
(iii) (අ) * අරටු ගැසුනු * ගොරෝසු
(ආ) (i) ඇටුවන් බැහී ගිය ගසක් මෙන් (ii) ගසක පොත්තක් මෙන් (ලකුණු 2 x 2 = 04)
(iv) (අ) * රත්තරන් මන්දිරයක / රන් මාලිගාවක * සැරසුවක්
(ආ) රත්තරන් මාලිගයක සිටියත් දුක් නැති නොවේ. මී පැණි කැවද බඩගින්න නොසන්සිදේ. මැණික් ආභරණ වලින් සැරසුවත් ශරීරය දිරා යයි. එමෙන්ම පැණිවරකා ගසට ද හෙන වදී. (ලකුණු 2 x 2 = 04)
(v) (අ) * විරුද්ධ / එරෙහි * අණ / අණසක / නියෝගය / නියමය
(ආ) ඔහුගේ නියමයට විරුද්ධ වීමට නොව ගැලපීමට වෙනත් මාර්ගයක් නොමැති නිසා මෙලෙස කරමි. මා වළක්වන්නට උත්සාහ කරන්නේ ඇයි.

03 - 07 දක්වා ප්‍රශ්නවලට නියමිත උදාහරණ / ගැලපෙන උදාහරණ ගෙන ඇත්දැයි සලකා ලකුණු පිරිනමන්න.
03 - 04 ප්‍රශ්න සඳහා ලකුණු 15 යි.
උදාහරණවලට ලකුණු 04 යි. / විචාරයට ලකුණු 11 යි.
05 - 07 ප්‍රශ්න සඳහා ලකුණු 10 යි.
උදාහරණවලට ලකුණු 03 යි. / විචාරයට ලකුණු 07 යි